**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**<u>පුවත්පත් නිවේදනය</u>**

## <u>“බුද්ධි තොරතුරු සහ ජාතික ආරක්ෂාව” සම්බන්ධයෙන් එක් දින අන්තර්ජාල වැඩමුළුව</u>

**“බුද්ධි තොරතුරු සහ ජාතික ආරක්ෂාව ” සම්බන්ධයෙන් එක් දින අන්තර්ජාල වැඩමුළුවක් ඉන්දීය රජයේ පොලිස් පර්යේෂණ සහ සංවර්ධන කාර්යාංශය විසින් ශ්‍රී ලංකා පොලිස් සහ බුද්ධි නිලධාරීන් වෙනුවෙන් 2021 පෙබරවාරි 16 වන දින පවත්වන ලදී. මෙහිදී අදහස් දක්වමින් මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා ප්‍රකාශ කළේ මෙවැනි පුහුණු වැඩසටහන් රටවල් දෙකටම වාසිදායක වන බව සහ ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන්ගේ කුසලතාවයන් ගොඩනැගීමෙහි ලා විශේෂයෙන්ම ප් රයෝජනවත් වන බවයි. පොදු ආරක්ෂක අභියෝගයන්ට ඉන්දියාව සහ ශ්‍රී ලංකාව විසින් සාමූහිකව මුහුණ දීමෙ වැදගත්කම මහ කොමසාරිස්තුමා මෙහිදී අවධාරණය කළ අතර දෙරට අතර ආරක්ෂක සහයෝගීතාවය ප් රවර්ධනය කළ යුතු බව ප්‍රකාශ කළේය.** තොරතුරු සහ අත්දැකීම් බෙදාහදා ගැනීම සඳහා පවතින යාන්ත්‍රණය අගය කළ මහ කොමසාරිස්තුමා විශේෂයෙන්ම පසුගිය මාසයන්හි දි ඉන්දීය ආරක්ෂක අංශයන් ශ්‍රී ලංකා ආරක්ෂක අංශයන්හි ඉල්ලීම මත, ඉන්දියාවට පලා ගොස් සිටි ශ්‍රී ලාංකික අපරාධකරුවන් අත්අඩංගුවට ගත් බව සඳහන් කළේය.

මෙම අවස්ථාවේදී ඉන්දීය රජයේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විශේෂ ලේකම් වී. එස්. කේ කෞමුදි මහතා වැඩමුළුව සංවිධානය කිරීම සම්බන්ධයෙන් සිය ප්‍රශංසාව පළ කළේය. විමර්ශන කටයුතු සම්බන්ධයෙන් ඉන්දියාවෙන් සහය ලබා ගන්නා අතර අන්‍යෝන්‍ය නීති ආධාර ගිවිසුමේ ප් රතිපාදනයන්ගෙන් **ප්‍රයෝජන** ගැනීමට ශ්‍රී ලංකා නියෝජිතායතනයන්ට හැකි බව එතුමා ප්‍රකාශ කළේය. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූ

පොලිස් විශේෂ ශාඛාවේ නියෝජ්‍ය පොලිස්පති ටී. සී. ඒ. ධනපාල මහතා වැඩමුළුවේ කටයුතු අගය කළ අතර මෙම වැඩමුළුව සංවිධානය කිරීම සම්බන්ධයෙන් ඉන්දීය රජයට සිය ස්තූතිය පළ කළේය.

ජනවාරි 27 වන දින ආරම්භ වූ ඉ - ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතා (e-ITEC) පුහුණු පාඨමාලා යටතේ මෙම වැඩමුළුව සංවිධානය කර තිබිණ. ත්‍රස්තවාදයට සහ අන්තවාදයට එරෙහිව කටයුතු කිරීම සහ ප්‍රභූන්ට සිදුවන තර්ජනයන් ඇතුළු ජාතික ආරක්ෂාව හා සම්බන්ධ මාතෘකා මෙම වැඩමුළුවේදී ආවරණය කෙරිණ. මෙම ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් වන ඩී. පී. සංිහා, සුදීප් ලඛ්තාකියා සහ ප්‍රභාකර් ආලෝක් යන මහත්වරුන් සිය අත්දැකීම් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූ නියෝජ්‍ය පොලිස්පතිවරුන් සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීන් ඇතුළු පොලිස් නිලධාරීන් 25 කට අධික පිරිසක් සමඟ බෙදාහදා ගත්හ. දැනට ක්‍රියාත්මක අන්තර්ජාල පුහුණු වැඩසටහන යටතේ පැවැත්වීමට නියමිත වැඩමුළු 10 න් 5 ක් මේ වන විට සාර්ථකව පවත්වා ඇති අතර ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන් 125 කට අධික සංඛ්‍යාවක් ඒ සඳහා සහභාගී වී ඇත.

****

***කොළඹ***
***2021 පෙබරවාරි 17***